දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ද්විතීය භාග 2015 පුනර් පරීක්ෂණය - 2019 දෙසැම්බර්/2020 ජනවාරි
Bachelor of Arts General (External) Degree Part II Repeat Examination 2015 – Dec. 2019/Janu. 2020

ආවිසා 3.1 - ප්‍රායෝගික ආර්ථික විද්‍යාව
ECG 3.1 - Applied Economics

කාලය පැය තුන යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න
පැහැදිලි අත් අකුරින් පිළිතුරු සපයන්න

---

01. i. සාර්ව සහභාගිත්ව ආර්ථික වෘද්ධිය (Inclusive economic growth) යන සංකල්පය නිර්වචනය කොට එය ශ්‍රී ලංකා ආර්ථිකය විෂයෙහි වැදගත් වන්නේ ඇයි ද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 04)

ii. ශ්‍රී ලංකාවේ තිරසර හා ඉහළ ආර්ථික වර්ධන මට්ටමක් අත්කර ගැනීමට එරෙහිව පවත්නා සංරෝධක පිළිබඳ විචාරාත්මක විග්‍රහයක් කරන්න.

(ලකුණු 08)

iii. ශ්‍රී ලංකාවේ දේශීය කෘෂිකර්මාන්තයේ පසුගාමීත්වයට ඉවහල් වී ඇති එම අංශයටම අනන්‍ය වූ ප්‍රධාන ගැටලු ඔබ හඳුනාගන්නේ කෙසේ ද?

(ලකුණු 08)

02. i. මෑතකාලීනව ශ්‍රී ලංකාවේ ආයෝජන වාතාවරණය දුර්මුඛ කිරීමෙහි ලා බලපා ඇති සාධක විග්‍රහ කරන්න.

(ලකුණු 10)

ii. ශ්‍රී ලංකාවේ බාහිර තරගකාරීත්වය ඉහළ නැංවීම සඳහා ඔබ විසින් යෝජනා කරනු ලබන මඟ පෙන්වීම් පිළිබඳ විමර්ශනයක් කරන්න.

(ලකුණු 10)

03. i. පසුගිය දශකය තුළ ශ්‍රී ලංකාවේ වෙළෙඳ ගිණුමේ අසතුටුදායක ප්‍රවනතා සඳහා තුඩුදුන් හේතු පැහැදිලි කරන්න.

(ලකුණු 08)

ii. ශ්‍රී ලංකාවේ අපනයන වර්ධන විභවතා පදනම්ව අපනයන ප්‍රවර්ධන උපායමාර්ගයක් සකස් කිරීමේ දී අවධානයට ලක්විය යුතු ක්ෂේත්‍ර පිළිබඳ අධ්‍යයනයක් කරන්න.

(ලකුණු 12)

04. i. මානව සංවර්ධන (Human Development) සංකල්පය අර්ථ දක්වන්න.

(ලකුණු 05)

ii. දකුණු ආසියානු කලාපයේ රටවල් අතර ශ්‍රී ලංකාවේ මානව සංවර්ධන මට්ටම පිළිබඳව ඔබගේ නිරීක්ෂණ මොනවා ද?

(ලකුණු 10)

iii. රටක සංවර්ධන මට්ටම මිනුම් කිරීම සඳහා යොදා ගන්නා මානව සංවර්ධන දර්ශකයේ දුර්වලතා ගෙන හැර දක්වන්න.

(ලකුණු 05)

05. "ශ්‍රී ලංකාවේ සමස්ත සේවාවියුක්ති අනුපාතිකය පහළ අගයක් වාර්තා කළ ද තරුණයන්, අධ්‍යාපන සුදුසුකම් සහිත පුද්ගලයන් සහ ස්ත්‍රීන්ගේ සේවා වියුක්තිය තවමත් ඉහළ මට්ටමක පවතී."

i. ප්‍රමාණාත්මක දත්ත සහ ඔබ දන්නා තොරතුරු උපයෝගී කරගනිමින් ඉහත ප්‍රකාශය පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ii. ශ්‍රී ලංකාවේ කාන්තාවන් ආර්ථිකමය වශයෙන් අක්‍රියවීමට බලපාන ලද හේතු ලේඛනගත කරන්න.

(ලකුණු 05)

iii. ශ්‍රී ලංකාවේ සේවා වියුක්තිය තව දුරටත් අවම කිරීම සඳහා වන ඔබගේ යෝජනා කෙටියෙන් දක්වන්න.

(ලකුණු 05)

06. i. උද්ධමනය (Inflation) යන සංකල්පය අර්ථ දක්වා ශ්‍රී ලංකාවේ උද්ධමනය මිනුම් කිරීමේ දී භාවිතා කෙරෙන මිල දර්ශක පිළිබඳ විග්‍රහයක් කරන්න.

(ලකුණු 06)

ii. ප්‍රමාණාත්මක දත්ත සහ කාලීන තොරතුරු ආශ්‍රයෙන් පසුගිය දශකයක පමණ කාල සීමාවේ ශ්‍රී ලංකාවේ උද්ධමනීය ප්‍රවනතා විශ්ලේෂණය කරන්න.

(ලකුණු 10)

iii. ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර (අපනයන) තරඟකාරිත්වය කෙරෙහි උද්ධමනය බල පෑ හැකි ආකාරය දක්වන්න.

(ලකුණු 04)

07. "1981 වසරේ දී මුළු ජනගහනයෙන් සියයට 6.6 ක් වූ වයස අවුරුදු 60 සහ ඊට වැඩි පුද්ගලයන්ගේ ප්‍රතිශතය වර්තමානයේ දී සියයට 12.4 ක් වීම තුළින් ශ්‍රී ලංකාව ජනගහනය වයස්ගතවීමේ සංසිද්ධියක් අත්විඳිමින් සිටී."

i. ඉහත ප්‍රකාශය කෙටියෙන් පැහැදිලි කොට එවැනි වාතාවරණයක් ඇතිවීමට බලපෑ හේතු දක්වන්න.

(ලකුණු 05)

ii. ශ්‍රී ලංකාවේ ප්‍රජා විද්‍යාත්මක සංක්‍රාන්තියෙහි සුවිශේෂී ලක්ෂණ ගෙනහැර දක්වන්න.

(ලකුණු 05)

iii. ජනගහනය වයස්ගතවීමේ ප්‍රවනතා නිසා ශ්‍රී ලංකා ආර්ථිකය මත ඇති කළ හැකි බරපතල සමාජ-ආර්ථික අභියෝග මොනවා ද යන්න පැහැදිලි කරන්න.

(ලකුණු 10)

08. i. ආදායම් දරිද්‍රතාව (Income poverty) සහ මානව දරිද්‍රතාව (Human poverty) යන සංකල්ප ඒවාට අදාළ වන මිණුම් ද අවධාරණය වන පරිදි පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ii. 2009/2010 - 2016 කාලසීමාවේ දී ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව පහත වැටීම සඳහා බලපෑ හේතු පැහැදිලි කරන්න.

(ලකුණු 08)

iii. දිගුකාලීනව ශ්‍රී ලංකාවේ දිළිඳුකම පහතහෙළීම සඳහා ඔබ විසින් යෝජනා කරන ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සඳහන් කරන්න.

(ලකුණු 06)